# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 2017 අංක 13 දරන ජාතිය ගොඩනැගීමේ බදු (සංශෝධන) පනත

---

**[සහතිකය සටහන් කළේ 2017 අගෝස්තු මස 09 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2017 අගෝස්තු මස 11 වැනි දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැක.

**මිළ : රු. 6.00 යි.** **තැපැල් ගාස්තුව : රු. 10.00 යි.**

## 2017 අංක 13 දරන ජාතිය ගොඩනැගීමේ බදු (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2017 අගෝස්තු මස 09 වන දින]

එල්.ඩී.—ඕ. 71/2016.

### 2009 අංක 9 දරන ජාතිය ගොඩනැගීමේ බදු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වන දිනය.

**1.** මේ පනත 2017 අංක 13 දරන ජාතිය ගොඩනැගීමේ බදු (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, වෙන් වශයෙන් වූ ක්‍රියාත්මක වීමේ දිනයන් මෙය යටතේ නිශ්චිතව සඳහන් කර ඇත්නම් මිස, 2017 අප්‍රේල් මස 1 වන දින සිට ක්‍රියාත්මක වූ ලෙස සලකනු ලැබිය යුතු ය.

2009 අංක 9 දරන පනතේ පළමුවන උපලේඛනය සංශෝධනය කිරීම.

**2.** 2016 අංක 22 දරන පනත මගින් අවසන්වරට සංශෝධිත (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 2009 අංක 09 දරන ජාතිය ගොඩනැගීමේ බදු පනතේ පළමුවන උපලේඛනය පහත දැක්වෙන පරිදි තවදුරටත් සංශෝධනය කරනු ලැබේ:—

(1) එම උපලේඛනයේ I වන කොටසෙහි -

(අ) (iv) අයිතමයේ (iv) වන උපඅයිතමයේ සිට "ආනයනය කරන ලද ද්‍රව්‍යයක්" යන වචන දක්වා වූ වචන සහ ඉලක්කම් ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:-

"(iv) වෙනත් යම් සමාන කාර්යයක් සඳහා බවට,

සහ එම ද්‍රව්‍යය ශ්‍රී ලංකාවට ආනයනය කිරීමේ දින සිට අවුරුදු එකක කාලයක් ඇතුළත හෝ එකී ව්‍යාපෘතිය සම්පූර්ණ කිරීමෙන් පසු, දින අනූවක් ඇතුළත ආපසු නැව්ගත කරනු ලබන බවට දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා සෑහීමකට පත්වන පරිදි ඔප්පු කරනු ලැබුවහොත් එසේ ආනයනය කරන ලද ද්‍රව්‍යයක්;";

(ආ) (xi) අයිතමය වෙනුවට පහත දැක්වෙන අයිතමය ආදේශ කිරීමෙන්:—

2—PL 005257—2,861 (2017/06)

"(xi) (අ) 2016 මැයි මස 2 වන දිනට පෙරාතුව වූ යම් කාල පරිච්ඡේදයක් සඳහා සහ 2016 ජූලි මස 11 වන දිනෙන් ආරම්භ වන හා 2016 නොවැම්බර් මස 1 වන දින හෝ එදිනට පෙර අවසන් වන කාල පරිච්ඡේදය සඳහා ඛනිජ තෙල් හා ඛනිජ තෙල් නිෂ්පාදන; හෝ

(ආ) 2016 මැයි මස 2 වන දිනෙන් ආරම්භ වන හා 2016 ජූලි මස 11 වන දිනෙන් අවසන් වන කාල පරිච්ඡේදය සහ 2016 නොවැම්බර් මස 1 වන දිනෙන් ආරම්භ වන කාල පරිච්ඡේදය සඳහා, රේගු කාර්ය සඳහා නිශ්චිතව සඳහන් කරන ලද ශීර්ෂ අංක යටතේ වර්ගීකරණය කරන ලද ලිහිසි තෙල් හැර ඛනිජ තෙල් හා ඛනිජ තෙල් නිෂ්පාදන;";

(ඇ) (xviඅ) අයිතමයේ "එයාර් ලංකා කේටරින් සර්විසස් ලිමිටඩ්" යන වචන වෙනුවට පහත දැක්වෙන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන්:—

"2017 අගෝස්තු මස 1 වන දිනට පෙරාතුව වූ යම් කාල පරිච්ඡේදයක් සඳහා එයාර් ලංකා කේටරින් සර්විසස් ලිමිටඩ්";

(ඈ) (xviii) අයිතමයේ "1972 අංක 5 දරන සමුපකාර සමිති" සිට "භාණ්ඩ ආනයනය හෝ විකිණීම" යන වචන හා ඉලක්කම් වෙනුවට පහත දැක්වෙන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන්:—

"1972 අංක 5 දරන සමුපකාර සංගම් පනත යටතේ ලියාපදිංචි කරන ලද යම් සමිතියක් හෝ එවැනි ලියාපදිංචි කිරීමක් සඳහා විධිවිධාන සලසමින් පළාත් සභාවක් විසින් පනවන ලද අදාළ ප්‍රඥප්තියක් යටතේ ලියාපදිංචි කරන ලද යම් සමිතියක් මගින් හෝ 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි කරන ලද ලක් සතොස මගින් 2017 අගෝස්තු මස 1 වන දිනට පෙරාතුව ආනයනය කරන ලද හෝ විකුණන ලද යම් භාණ්ඩයක්;";

(ඉ) එහි (L) අයිතමයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අයිතමය ඇතුළත් කිරීමෙන්:—

"(LI) පුවත්පත් හැර, නිශ්චිතව සඳහන් කරන ලද ශීර්ෂ අංක යටතේ වර්ගීකරණය කරන ලද මුද්‍රිත ග්‍රන්ථ, සඟරා හෝ ජර්නල් සඟරා හෝ වාර සඟරා.";

(2) එම උපලේඛනයේ II වන කොටසෙහි -

(අ) (ii) අයිතමය වෙනුවට පහත දැක්වෙන අයිතමය ආදේශ කිරීමෙන්:—

"(ii) (අ) 2016 මැයි මස 2 වන දිනට පෙර අවසන් වූ යම් කාල පරිච්ඡේදයක් සඳහා සහ 2016 ජූලි මස 11 වන දිනෙන් ආරම්භ වන නමුත් 2017 අප්‍රේල් මස 1 වන දිනට පෙර කාල පරිච්ඡේදය සඳහා විදුලිබලය සැපයීම;

(ආ) 1969 අංක 17 දරන ලංකා විදුලිබල මණ්ඩල පනත යටතේ ස්ථාපනය කරන ලද ලංකා විදුලිබල මණ්ඩලය මගින් සිදු කරනු ලබන විදුලිබල සැපයුම හැර, 2017 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව විදුලිබල උත්පාදනය හා විදුලිබල සැපයුම;";

(ආ) (vii) අයිතමය වෙනුවට පහත දැක්වෙන අයිතමය ආදේශ කිරීමෙන්:—

"(vii) එකී සේවා, ගොඩනැගිලි, පාරවල්, පාලම්, ජල සැපයුම, ජලය හෝ මල ප්‍රවාහන පද්ධති, වරාය, ගුවන් තොටුපල ඉදිකිරීම් හෝ විදුලි සංදේශ හෝ විදුලි බලය පිළිබඳ යටිතල පහසුකම් ව්‍යාපෘතියක් සම්බන්ධ ඉදිකිරීම් වනතාක් දුරට,

(අ) 2011 ජනවාරි මස 1 වන දිනට පෙරාතුව උප කොන්ත්‍රාත්කරුවකු නොවන ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවකු සලසන ලද සේවා; හෝ

(ආ) 2011 ජනවාරි මස 1 වන දින හෝ එදිනට පසු නමුත් 2017 අගෝස්තු මස 1 වන දිනට පෙරාතුව ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවකු හෝ උප කොන්ත්‍රාත්කරුවකු සලසන ලද සේවා; හෝ

(ඇ) 2017 අගෝස්තු මස 1 වන දින හෝ එදිනට පසු ඉදිකිරීම් උප කොන්ත්‍රාත්කරුවකු සලසන සේවා;";

(ඇ) (xiv) අයිතමය වෙනුවට පහත දැක්වෙන අයිතමය ආදේශ කිරීමෙන්:—

"(xiv) යම් ගමන් නියෝජිතයකු එකී නියෝජිතයා ලංකා සංචාරක මණ්ඩලය වෙත ලියාපදිංචි වී ඇත්නම්, එකී නියෝජිතයා විසින් රට ඇතුළත සංචාර සම්බන්ධයෙන් -

(අ) 2017 අගෝස්තු මස 1 වන දිනට පෙර සලසන ලද සේවා;

(ආ) 2017 අගෝස්තු මස 1 වන දින හෝ එදිනට පසු සලසනු ලබන සේවා, එකී සේවාවක් සඳහා වන ගෙවීම් විදේශ ව්‍යවහාර මුදල්වලින් බැංකුවක් හරහා සිදු කරන්නේ නම්;";

(ඈ) (xxii) අයිතමය වෙනුවට පහත දැක්වෙන අයිතමය ආදේශ කිරීමෙන්:—

"(xxii) ශ්‍රී ලංකාවෙන් පිටත දී උපයෝජනය කිරීම සඳහා විදේශ මුදල් ශ්‍රී ලංකාවට බැංකුවක් හරහා ප්‍රේෂණය කරනු ලබන්නේ නම්, විදේශ ව්‍යවහාර

මුදල්වලින් ගෙවීම සඳහා ශ්‍රී ලංකාවෙන් පිටත යම් තැනැත්තකුට හෝ හවුල් ව්‍යාපාරයකට ශ්‍රී ලංකාව තුළදී හෝ ශ්‍රී ලංකාවෙන් පිටත දී සලකනු ලබන යම් සේවාවක්;";

(ඉ) (xxxiv) අයිතමයේ "1972 අංක 5 දරන සමුපකාර සංගම්" සිට "සලසනු ලබන සේවා" යන වචන හා ඉලක්කම් වෙනුවට පහත දැක්වෙන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන්:—

"1972 අංක 5 දරන සමුපකාර සංගම් පනත හෝ පළාත් සභාවක් මගින් පනවනු ලැබූ යම් ප්‍රඥප්තියක් හෝ යටතේ ලියාපදිංචි කළ යම් සංගමයක් හෝ 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි කොට ඇති ලක් සතොස සමාගම හෝ විසින් 2017 අගෝස්තු මස 1 වන දිනට පෙරාතුව සලසන ලද සේවා;";

(ඊ) (xxxviii) අයිතමය වෙනුවට පහත දැක්වෙන අයිතමය ආදේශ කිරීමෙන්:—

"(xxxviii) 2017 අගෝස්තු මස 1 වන දිනට පෙර අවසන් වූ යම් කාල පරිච්ඡේදයක් සඳහා, පදිංචිය සඳහා නිවාස පහසුකම් සැලසීමට අදාළ ඉදිකිරීම් ව්‍යාපෘතියක වටිනාකම ඇමරිකානු ඩොලර් මිලියන දහයකට හෝ වෙනත් ව්‍යවහාර මුදලකින් ඊට සමාන මුදලකට අඩු නොවන තාක් දුරට පදිංචිය සඳහා නිවාස පහසුකම් ඉදිකිරීම හා විකිණීම සඳහා වන දේපළ වෙළඳාම් හා ඒවා වැඩි දියුණු කිරීමේ ව්‍යාපාරයක්;";

(ඌ) එහි (xxxviii) අයිතමයට පසු, පහත දැක්වෙන නව අයිතමය එකතු කිරීමෙන්:—

"(xxxix) බාහිර පිවිසුම් ක්‍රියාකරුවන් විසින් දේශීය ක්‍රියාකරුවන් වෙත සපයනු ලබන ජාත්‍යන්තර විදුලි සංදේශ සේවා.".

වලංගු වීම.

**3.** 2017 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වී, මෙම පනත සම්බන්ධයෙන් කථානායකවරයාගේ සහතිකය ඔහුගේ අත්සන ඇතිව සටහන් කරනු ලැබූ දිනයෙන් අවසන් වන කාල සීමාව තුළ දී, මේ පනතේ විධිවිධාන සැලකිල්ලට ගනිමින් ගණනය කරනු ලැබූ බදු මුදල ප්‍රධාන ප්‍රඥප්තියේ පිළිවෙළින් 4 වන හෝ 5 වන වගන්තිවල විධිවිධාන යටතේ අවස්ථාවෝචිත පරිදි, දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා හෝ රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් මේ පනතේ විධිවිධාන අදාළ වන යම් තැනැත්තකුගෙන් එකතු කරනු ලබන අවස්ථාවක දී, එම එකතු කිරීම සියලු කාර්ය සඳහා වලංගු ලෙස අය කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය:

එසේ වුව ද, මේ වගන්තියේ ඉහතින් වූ විධිවිධාන, ඉහත කී කාලසීමාව තුළ එකතු කරන ලද යම් බද්දක් සම්බන්ධයෙන් යම් අධිකරණයකින් දෙන ලද යම් තීරණයකට හෝ යම් ආඥාවකට හෝ අධිකරණයක අවසන් නොවී පවතින නීති කෘත්‍යයකට හෝ බලපානු නොලැබිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**4.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 875 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළෙඹන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකි ය.